www.agaram.lk

37735

AL/2020/29/S-I (NEW/OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව/පැරණි නිර්දේශය – புதிய/பழைய பாடத்திட்டம் – New/Old Syllabus

NEW/OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I
தொடர்பாடலும் ஊடகக் கற்கையும் I
Communication and Media Studies I

29 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **A**, **B** හා **C** යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ. **A කොටස** තුළ **පැරණි හා නව නිර්දේශය** ද **B කොටස** තුළ **පැරණි නිර්දේශය** ද **C කොටස** තුළ **නව නිර්දේශය** ද ආවරණය කරමින් ප්‍රශ්න ඇතුළත් කර ඇත.
* **A කොටසේ 1** සිට **25** දක්වා ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
* **B හෝ C කොටස්** අතුරෙන් **එක් කොටසක් පමණක්** තෝරාගෙන **26** සිට **50** දක්වා ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

## A කොටස

**1.** සන්නිවේදනය,
(1) සංකේතාත්මක වූවකි. (2) තාක්ෂණික වූවකි. (3) අවස්ථාමය වූවකි.
(4) ද්විමාර්ගික වූවකි. (5) බහුමාර්ගික වූවකි.

**2.** ලේඛකයෙක් තම අත්දැකීම් ප්‍රතිනිර්මාණය කරමින් පුවත්පතකට විශේෂාංග ලිපියක් ලිවීමට සිතුවේ ය. මෙය වඩාත් ගැළපෙන්නේ,
(1) ලිඛිත සන්නිවේදනයට ය. (2) ජනසන්නිවේදනයට ය.
(3) මුද්‍රිත සන්නිවේදනයට ය. (4) අවිධිමත් සන්නිවේදනයට ය.
(5) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයට ය.

**3.** ෂැනන් හා වීවර් සන්නිවේදන ආකෘතියෙහි අන්තර්ගත **නොවන්නේ**,
(1) බාධකයයි. (2) සංදේශයයි. (3) මූලාශ්‍රයයි.
(4) බලපෑමයි. (5) සංඥාවයි.

**4.** දැනුම් සමාජය වර්ධනය කිරීමෙහිලා ඓතිහාසික කාර්යභාරයක් ඉටුකරනු ලැබුවේ,
(1) පුවත්පතයි. (2) පොතයි. (3) සඟරාවයි.
(4) අත් පත්‍රිකාවයි. (5) දැන්වීමයි.

**5.** මානව සමාජය තුළ සන්නිවේදනය මගින් සිදුකරනු ලබන ප්‍රබල සමාජ මෙහෙවර වන්නේ,
(1) අදහස් පොදු බවට පත්කිරීමයි. (2) විනෝදාස්වාදය ලබාදීමයි.
(3) ශික්ෂණය ඇති කිරීමයි. (4) ග්‍රාහක බලපෑම ඇතිකිරීමයි.
(5) අන්තර් සම්බන්ධතා ගොඩනැගීමයි.

**6.** පුවත්පතෙහි භාෂා භාවිතය,
(1) සාම්ප්‍රදායික විය යුතු ය. (2) සංකීර්ණ විය යුතු ය. (3) සරල විය යුතු ය.
(4) වර්ණනාත්මක විය යුතු ය. (5) විදග්ධ විය යුතු ය.

**7.** ජනශ්‍රැතිය, සන්නිවේදන ස්වරූපයක් ලෙස වැදගත් වන්නේ, එය,
(1) පුද්ගලාන්තර සන්නිවේදන ක්‍රමයක් බැවිනි.
(2) කථන සන්නිවේදන ක්‍රමයක් බැවිනි.
(3) නිර්මාණාත්මක මූලාශ්‍රයක් ලෙස යොදාගත හැකි බැවිනි.
(4) ග්‍රාමීය තොරතුරු ඉදිරිපත් කරන බැවිනි.
(5) දේශීය සන්නිවේදන ආකෘතියක් ඉදිරිපත් කරන බැවිනි.

[ දෙවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



8. රූපවාහිනියෙන් විකාශය වූ නර්තනාංග සහිත ගීතයට අනුව කමල් සිය කාමරය තුළ තනිව ම අත්පොළසන් දෙමින් නර්තනයෙහි යෙදිණි. මෙහි දක්නට ලැබෙන්නේ
(1) විකේතකරණ ක්‍රියාවලියකි. (2) සංජානන ක්‍රියාවලියකි.
(3) සන්නිවේදන ක්‍රියාවලියකි. (4) ප්‍රතිපෝෂණ ක්‍රියාවලියකි.
(5) නර්තන ක්‍රියාවකි.

9. ගුරුවරයා පන්ති කාමරයට පැමිණ පාඩම් පොත පෙරළන විටම පාරේ ගිය වාහනයකින් නිකුත් වූ සයිරන් නලා හඬ නිසා ළමයි එකිනෙකාගේ මුහුණු බලා ගත්හ. මෙහි දක්නට ලැබෙන්නේ,
(1) අවිධිමත් සන්නිවේදනයකි. (2) සන්නිවේදන බාධකයකි.
(3) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයකි. (4) නිර්වාචික සන්නිවේදනයකි.
(5) ශබ්ද සන්නිවේදනයකි.

10. සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංගවලට ඇතුළත් **නොවන** වරණය කුමක්ද?
(1) මාධ්‍ය, විකේතකරය, සන්දර්භය සහ බලපෑම
(2) සන්නිවේදකයා, විකේතකරය, බලපෑම සහ බාධකය
(3) ග්‍රාහකයා, ප්‍රතිපෝෂණය, රූපණය සහ නාලිය
(4) ආකේතකරය, අත්දැකීම් පසුතලය, බාධකය සහ ග්‍රාහකයා
(5) ආකේතකරය, ප්‍රතිපෝෂණය, මූලාශ්‍රය සහ නාලිය

11. කොරෝනා වසංගතය පිළිබඳ තොරතුරු පදනම් කරගෙන චීනයෙහි නිර්මාණය වූ වාර්තා චිත්‍රපටයක් ශ්‍රී ලංකාවේ ද එම රෝග ව්‍යාප්ත වූ ප්‍රදේශවල ප්‍රදර්ශනය කරන ලදී. මෙය වඩාත් වැදගත් වන්නේ,
(1) කොරෝනා පිළිබඳ පළමුව තොරතුරු වාර්තා වන්නේ චීනයෙන් වන බැවිනි.
(2) දෘශ්‍ය මාධ්‍ය වඩාත් ප්‍රබල වන බැවිනි.
(3) සමූහ සන්නිවේදන ක්‍රියාවක් වන බැවිනි.
(4) සමාන අත්දැකීම් ක්ෂේත්‍රයක් ගැන තොරතුරු ලැබෙන බැවිනි.
(5) අන්තර් සංස්කෘතික සම්බන්ධතා ගොඩ නැගෙන බැවිනි.

12. කමල් තම නැගණියට පරිගණකය භාවිත කරමින් ග්‍රැෆික් චිත්‍රයක් නිර්මාණය කිරීම සඳහා උපදෙස් ලබා දී එහි වර්ණ යොදා ගත යුතු ආකාරය පැහැදිලි කළේය. මෙහි දක්නට ලැබෙන සන්නිවේදන කාර්යය වන්නේ,
(1) අධ්‍යාපනය ලබා දීමයි. (2) තොරතුරු සම්පාදනයයි. (3) නිර්මාණකරණයයි.
(4) සමාජානුයෝජනයයි. (5) පෙළඹවීමයි.

13. සන්නිවේදන විෂය ක්ෂේත්‍රයට අදාළ කරුණු තුනක් පහත දැක්වේ.
- පොදු අරමුණු සහිතයි.
- ඒකමාර්ගික හෝ ද්විමාර්ගිකයි.
- ප්‍රතිචාර-ප්‍රතිපෝෂණ සහිතයි.

ඉහත කරුණු වඩාත් සම්බන්ධ වන්නේ,
(1) පුද්ගලාන්තර සන්නිවේදනයට ය. (2) සමූහ සන්නිවේදනයට ය.
(3) වාචික සන්නිවේදනයට ය. (4) විධිමත් සන්නිවේදනයට ය.
(5) උපදේශාත්මක සන්නිවේදනයට ය.

14. පිටිසර ගමක වැව ආශ්‍රිත ව සිදුවන චාරිත්‍ර පිළිබඳ ගම්වැසියන්ගෙන් තොරතුරු අසා, ලබාගත් අවබෝධයෙන් හා අත්දැකීමෙන් ගුවන්විදුලි නිවේදකයා සාර්ථකව වැඩසටහන ඉදිරිපත් කළේය. මෙම අවස්ථාව වඩාත් ගැළපෙන්නේ කුමන සන්නිවේදන විද්‍යාඥයාගේ නිර්වචනයට ද?
(1) හැරල්ඩ් ලැස්වෙල් (2) වෝල්ටර් ලිප්මන් (3) චාල්ස් කූලි
(4) එඩ්වඩ් සැපීර් (5) ෂැනන් හා වීවර්

15. "ජනමාධ්‍ය සංදේශවල ස්වරූපය විස්තීරණ ය." ඒවා අවබෝධ කරගැනීමට හා අර්ථකථනය කරගැනීමට ග්‍රාහකයා තුළ පැවතිය යුතු ශක්‍යතාව වන්නේ,
(1) මාධ්‍ය විචාරයයි. (2) සහවේදනයයි.
(3) මාධ්‍ය සාක්ෂරතාවයි. (4) සංජානනයයි.
(5) අන්තර්ඥානයයි.

16. පොදු ජනතාවගේ ශ්‍රම ක්‍රියාකාරීත්වය හඳුනාගත හැකි සංස්කෘතික ප්‍රභේදයක් වන්නේ,
(1) ජනප්‍රිය සංස්කෘතියයි. (2) ජන සංස්කෘතියයි.
(3) සම්භාව්‍ය සංස්කෘතියයි. (4) මාධ්‍ය සංස්කෘතියයි.
(5) ගෝලීය සංස්කෘතියයි.

[ තුන්වැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk

www.agaram.lk



17. අති දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශයක ඩෙංගු වසංගතය පැතිරෙන විට දී එම රෝගයෙන් ඔවුන් මුදවා ගැනීම සඳහා අවබෝධයක් ලබාදීමට යොදාගත හැකි වඩාත් සුදුසු සන්නිවේදන ක්‍රමය කුමක්ද?
(1) සමාජ මාධ්‍ය (2) පෝස්ටර් (3) වාර්තා චිත්‍රපට
(4) ජනසන්නිවේදනය (5) පුද්ගලාන්තර සන්නිවේදනය

18. මාධ්‍ය සාක්ෂරතාව හා සම්බන්ධ කුසලතාවක් ලෙස සැලකිය **නොහැකි** ප්‍රකාශය වන්නේ, මාධ්‍ය සංදේශ,
(1) පරිභෝජනයට ඇති රුචිකත්වයයි. (2) සංජානනය කිරීමේ හැකියාවයි.
(3) බලපාන ආකාරය හඳුනාගැනීමයි. (4) ක්‍රියාවලිය හඳුනාගැනීමයි.
(5) නිර්මාණය කිරීමේ හැකියාවයි.

19. ජනප්‍රිය සංස්කෘතිය පිළිබඳ පහත දැක්වෙන අදහස්වලින් **සාවද්‍ය** අදහස කුමක්ද?
(1) සන්නිවේදන තාක්ෂණය හා සම්බන්ධ වීම
(2) වාණිජ්‍යමය නිෂ්පාදන හා බැඳී පැවතීම
(3) ළමයින් වඩාත් ආකර්ෂණය කර ගැනීම
(4) කලාත්මක ලක්ෂණවලින් ඉහළ අගයක් ගැනීම
(5) සමාජ චර්යාවන් සඳහා බලපෑමක් සිදු කිරීම

20. 'මහජන සම්බන්ධතාව' පිළිබඳ නිවැරදි අදහස නිරූපණය වන ප්‍රකාශය තෝරන්න.
(1) ප්‍රචාරණයෙන් වෙනස් නොවෙයි.
(2) දැන්වීම්කරණයෙන් වෙනස් නොවෙයි.
(3) අලෙවිකරණයෙන් වෙනස් නොවෙයි.
(4) අලෙවි ප්‍රවර්ධනයෙන් වෙනස් නොවෙයි.
(5) කෙටිකාලීන ප්‍රතිඵල අපේක්ෂාවෙන් වෙනස් නොවෙයි.

21. ජනකථා පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහතින් දැක්වේ.
*A* - සමාජ විඥානය පිළිබිඹු කරයි.
*B* - කර්තෘත්වය නිශ්චිතව විද්‍යමාන කරයි.
*C* - සංස්කෘතික සම්ප්‍රේෂණය සිදුකරයි.
*D* - මිථ්‍යා මූලාශ්‍ර මත පමණක් පදනම් වී තිබේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ,
(1) *A* හා *B* ය. (2) *A* හා *C* ය. (3) *B* හා *C* ය. (4) *B* හා *D* ය. (5) *C* හා *D* ය.

22. ජනතාව විරැකියාවෙන් පෙළීම හා සමාජයේ දක්නට ලැබෙන අසමානතාව, සංවර්ධන ගැටලු බව පෙන්වාදුන් විද්වතා වන්නේ,
(1) විල්බර් ශ්‍රාම් ය. (2) මහත්මා ගාන්ධි ය.
(3) එවරට් එම්. රොජර්ස් ය. (4) ඩඩ්ලි සියර්ස් ය.
(5) විමල් දිසානායක ය.

23. පන්ති කාමරය තුළ නිර්මාණාත්මක සන්නිවේදනයට අදාළව ඇති වූ සංවාදයක දී පහත සඳහන් අදහස් ඉදිරිපත් විය.
රේණුකා - නිර්මාණශීලී කියවීමෙන් මතුපිට අර්ථයට වැඩි යමක් ග්‍රහණය කරගත හැකි ය.
මාතු - නිර්මාණශීලී කියවීම සඳහා මාධ්‍ය සාක්ෂරතාව අත්‍යවශ්‍ය වේ.
චමිලි - නිර්මාණාත්මක චින්තනයේ දී පරිකල්පනය වැදගත් සාධකයකි.
රන්ජන් - නිර්මාණශීලී කියවීම ලේඛන කලාවට ම විශේෂ වූවකි.
මේ අතුරෙන් නිවැරදි ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ,
(1) රේණුකා, මාතු, හා චමිලි ය.
(2) රේණුකා, මාතු හා රන්ජන් ය.
(3) රේණුකා, චමිලි හා රන්ජන් ය.
(4) මාතු, චමිලි හා රන්ජන් ය.
(5) රේණුකා, මාතු, චමිලි හා රන්ජන් යන සියල්ලන්ම ය.

24. සමාජ දැනුම ලබාදීම මෙන්ම විවිධ අවස්ථාවල දී හැසිරිය යුතු ආකාරය පිළිබඳ දැනුවත් කිරීමේ මාධ්‍ය මෙහෙවර අදාළ වන්නේ,
(1) ස්ව-සංකල්පයටයි. (2) නිරීක්ෂණයටයි.
(3) සමාජානුයෝජනයටයි. (4) සංජානනයටයි.
(5) සාක්ෂරතාවටයි.

[ හතරවැනි පිටුව බලන්න

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**25.** මාධ්‍යයන්හි භාෂා භාවිතය පිළිබඳ ප්‍රකාශ හතරක් පහත දැක්වේ.

*A* - තිරය පදනම් කරගනිමින් රචනා කරයි.
*B* - ඉලක්ක කණ්ඩායම අනුව භාෂාව භාවිත වේ.
*C* - රූපය හා ශබ්දය සමාන ප්‍රබලතාවකින් සමන්විත වේ.
*D* - නිර්මාණාත්මකව රචනා කිරීමෙන් ග්‍රාහක පරිකල්පනය පුළුල් වේ.

ඉහත ප්‍රකාශවලින් නිරූපණය වන මාධ්‍ය අනුපිළිවෙළ කුමක්ද?

(1) සිනමාව, ගුවන්විදුලිය, රූපවාහිනිය හා පුවත්පත
(2) රූපවාහිනිය, පුවත්පත, සිනමාව හා ගුවන්විදුලිය
(3) සිනමාව, රූපවාහිනිය, ගුවන්විදුලිය හා පුවත්පත
(4) රූපවාහිනිය, ගුවන්විදුලිය, සිනමාව හා පුවත්පත
(5) සිනමාව, පුවත්පත, රූපවාහිනිය හා ගුවන්විදුලිය

## B කොටස

**26.** නව යටත් විජිතවාදී ක්‍රියාමාර්ගයක් ලෙස හැඳින්වෙන සංස්කෘතික ප්‍රවණතාව වන්නේ, සංස්කෘතික

(1) කම්පනයයි. (2) ආක්‍රමණයයි. (3) හුවමාරුවයි.
(4) විසරණයයි. (5) ත්වරණයයි.

**27.** ග්‍රාහකයාට නව අවබෝධයක් හා දැනුමක් ලබාදීම සඳහා ඉදිරිපත් කරන සංදේශ හඳුන්වනු ලබන්නේ,

(1) මෙහෙයුම් සංදේශ යනුවෙනි. (2) නඩත්තු සංදේශ යනුවෙනි.
(3) ශක්ති ජනක සංදේශ යනුවෙනි. (4) සංජානන සංදේශ යනුවෙනි.
(5) ක්‍රියාකාරී සංදේශ යනුවෙනි.

**28.** රාමායණය නාට්‍යයේ දී හනුමන්තා සිය රක්ත වර්ණ දෙනෙත් සසල කරමින් ප්‍රවේගකාරී රංගනයක් ඉදිරිපත් කළේය. රංගවේදී උපක්‍රම අනුව මෙහි දක්නට ලැබෙන්නේ,

(1) ආංගික අභිනයකි. (2) නිර්වාචික සන්නිවේදනයකි.
(3) තාත්වික ශෛලියකි. (4) සාත්වික අභිනයකි.
(5) අවස්ථා නිරූපණයකි.

**29.** මාධ්‍ය විචාරයේ දී සමාජ සම්බන්ධතා හා සමාජ බලවේග පිළිබඳ වඩාත් අවධානයකින් විවරණය කළ හැකි වන්නේ,

(1) සදාචාරාත්මක ප්‍රවේශයෙනි. (2) සෞන්දර්යාත්මක ප්‍රවේශයෙනි.
(3) භාෂාත්මක ප්‍රවේශයෙනි. (4) ඓතිහාසික ප්‍රවේශයෙනි.
(5) දේශපාලනික ප්‍රවේශයෙනි.

**30.** නායර් හා වයිට්ගේ සංවර්ධන සන්නිවේදනය පිළිබඳ හුවමාරු මාදිලියට අදාළ ලක්ෂණයක් වන්නේ,

(1) ආගමික පදනමක් සහිත වීම යි.
(2) සහභාගීත්ව තීරණ ගැනීමයි.
(3) ජන සංස්කෘතිය පදනම් කර ගැනීම යි.
(4) ජනමත නායකයින් යොදා ගැනීම යි.
(5) මහජනයා විසින් මහජනයා උදෙසා ක්‍රියාත්මක වීම යි.

**31.** පොදු ජනතා ජයග්‍රහණය සතුරු බලවේගවල බලපෑමෙන් මුදා ගැනීම පිණිස මාධ්‍ය නිදහස හා වගකීම රජය මගින් පාලනය කළ යුතු බව අවධාරණය කරනු ලබන සන්නිවේදන සංකල්පය කුමක්ද?

(1) අධිපතිවාදී (2) සෝවියට් කොමියුනිස්ට් (3) සමාජ වගකීම්
(4) නිදහස් මතවාදී (5) ප්‍රජාතන්ත්‍රවාදී

**32.** ශිෂ්‍යයන් කණ්ඩායමක් සිදුකළ සාකච්ඡාවක දී පහත අදහස් ඉදිරිපත් විය.

රුවන් - විවිධාකාරයේ අදහස්වලට අනුව ක්‍රියාකළ යුතු ය.
ගයනි - නිදහස් මතධාරීන් සිටිය යුතු ය.
ආකාශ් - තනි මතයකට පිරිස එකඟ කර ගත යුතු ය.
කමනි - විවිධ අදහස් මතුවීමට ඉඩ දී සාකච්ඡා කළ යුතු ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් විසම්මුතිය හා ගැළපෙන ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ,

(1) රුවන් හා ගයනි ය. (2) ගයනි හා ආකාශ් ය.
(3) ආකාශ් හා කමනි ය. (4) රුවන් හා ආකාශ් ය.
(5) ගයනි හා කමනි ය.

[ පස්වැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**33.** මහජන සම්බන්ධතාව සඳහා ඡායාරූප භාවිතයට ගැනීම පිළිබඳ **නොගැළපෙන** අදහස කුමක්ද?
(1) ක්‍රියාකාරී ඡායාරූප වඩාත් යෝග්‍ය වීම
(2) විවිධ විශේෂ අවස්ථාවන් ප්‍රදර්ශනය කිරීම
(3) ඡායාරූපයක් දීර්ඝ කාලයක් ප්‍රදර්ශනය කිරීම
(4) නිශ්චල ඡායාරූප අවස්ථානුකූලව භාවිත කිරීම
(5) විවිධ ප්‍රමාණයේ ඡායාරූප යොදා ගැනීම

**34.** භාෂාව පිළිබඳ පහත දැක්වෙන අදහස්වලින් **සාවද්‍ය** අදහස තෝරන්න.
(1) භාෂා ප්‍රශ්න නිසා රටවල් තුළ ආරවුල් ඇතිවී තිබේ.
(2) භාෂාව මිනිසාගේ ශ්‍රමය හසුරුවයි.
(3) බලය පවත්වා ගැනීමට භාෂාව උපකාරී වේ.
(4) උපභාෂා නිසා ප්‍රධාන භාෂාව වෙනස් වේ.
(5) භාෂාව හා සංස්කෘතිය අතර සම්බන්ධතාව දුරස්ථ වේ.

**35.** රටක සංවර්ධනය සඳහා බලපාන දේශපාලන හා සංස්කෘතික ගැටලුවක් ලෙස සැලකිය හැක්කේ,
(1) ජාතික චින්තනයක් හා ප්‍රතිපත්තියක් නොමැති වීමයි.
(2) මාධ්‍ය වාණිජ්‍යකරණය නොවීමයි.
(3) ආගමික කේන්ද්‍රීය නොවීමයි.
(4) සාම්ප්‍රදායික බවින් බැහැර වීමයි.
(5) වෙනස පිළිබඳ සැකමුසු බවක් නොමැති වීමයි.

**36.** පහත ප්‍රකාශවලින් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) දේව, යක්ෂ, ප්‍රේත සම්බන්ධතාව ජන ඇදහිලි හා විශ්වාසවල නොමැත.
(2) ජන ඇදහිලි, විශ්වාසවල සමාජ විද්‍යාත්මක යථාර්ථයක් නොමැත.
(3) ජන ආගම් හා ඇදහිලි, ජන විශ්වාසවලින් වියුක්තව නොපවතී.
(4) නැගෙනහිර රටවල ඇදහිලි විශ්වාස විරල ය.
(5) ඇදහිලි, විශ්වාස ජනයාගේ ජීවන චර්යාවන්ට බලපෑම් නොකරයි.

**37.** සන්නිවේදනයේ දී භාවිතවන යෙදුම් කිහිපයක් පහතින් දැක්වේ.

*A* - සහවේදනය *B* - නිරීක්ෂණය
*C* - විශ්ලේෂණය *D* - තදාත්මීකරණය
*E* - සංස්ලේෂණය *F* - සම්පරීක්ෂණය

ඉහත කරුණු අතුරෙන් ඥාන ගවේෂණයේ දී යොදාගන්නා ශිල්පක්‍රම වන්නේ,
(1) *A*, *B*, *C*, හා *D* ය. (2) *A*, *B*, *D*, හා *E* ය.
(3) *B*, *C*, *D*, හා *E* ය. (4) *B*, *C*, *E*, හා *F* ය.
(5) *C*, *D*, *E*, හා *F* ය.

**38.** ගැටුම් නිරාකරණය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහතින් දැක් වේ.

*A* - නංගි, ඔබේ මතය හරි. මගේ අදහස මම වෙනස්කර ගන්නම්.
*B* - ඕක අපි දෙගොල්ලන්ටම සතුටු වෙන්න බැරි වැඩක්.
*C* - ඔව්, ඒ විසඳුමට දෙන්නටම එකඟවෙන්න පුළුවන්.

ඉහත අවස්ථා හා අනුරූප තත්ත්ව වන්නේ,
(1) *A* ජය-පරාජය *B* පරාජය-පරාජය *C* ජය-ජය
(2) *A* ජය-පරාජය *B* පරාජය-ජය *C* ජය-ජය
(3) *A* ජය-ජය *B* පරාජය-පරාජය *C* ජය-පරාජය
(4) *A* ජය-ජය *B* ජය-පරාජය *C* පරාජය-පරාජය
(5) *A* පරාජය-පරාජය *B* ජය-පරාජය *C* ජය-ජය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk


[ හයවැනි පිටුව බලන්න.

agaram.lk

www.agaram.lk



- අංක **39** සිට **42** දක්වා වූ ප්‍රශ්න සඳහා පහත දැක්වෙන රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.




**39.** ඉහත රූප සටහනින් දැක්වෙන්නේ සන්නිවේදන ආකෘතියක අන්තර්ගත කරුණු ය. එහි A, B හා C වලට අයත් කරුණු පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

(1) ආකේතකරය, විකේතකරය, ප්‍රතිපෝෂණය
(2) සන්නිවේදකයා, පණිවිඩය, නාලිය
(3) විකේතකරය, ප්‍රතිපෝෂණය, සන්නිවේදකයා
(4) ආකේතකරය, ග්‍රාහකයා, පණිවිඩය
(5) ආකේතකරය, පණිවිඩය, විකේතකරය

**40.** ඉහත දැක්වෙන රූප සටහන අනුව A, B හා C අතර සිදුවන ක්‍රියාවලිය හේතුවෙන්,

*J* - රේඛීය සන්නිවේදනයක් සිදුවන බව දක්නට ලැබෙයි.
*K* - ප්‍රතිපෝෂණය සිදුවන බව පැහැදිලි ය.
*L* - බාධාවක් සිදුවී ඇත්දැයි හඳුනාගත හැකි ය.
*M* - සංදේශය වටහාගත් ආකාරය පැහැදිලි ය.

මෙම ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ,

(1) *J* හා *K* පමණි. (2) *K* හා *L* පමණි. (3) *L* හා *M* පමණි.
(4) *J*, *K* හා *L* පමණි. (5) *K*, *L* හා *M* පමණි.

**41.** ඉහත දක්වා ඇති රූප සටහනෙහි ඇතුළත් කරුණු වඩාත් සමීප වන සන්නිවේදන ආකෘතිය කුමක් ද?

(1) ඇරිස්ටෝටල් හා හැරල්ඩ් ලැස්වෙල් (2) චාල්ස් ඔස්ගුඩ් හා විල්බර් ශ්‍රාම්
(3) ඩේවිඩ් බර්ලෝ හා විල්බර් ශ්‍රාම් (4) ක්ලෝඩ් ෂැනන් හා වොරන් වීවර්
(5) වොරන් වීවර් හා චාල්ස් ඔස්ගුඩ්

**42.** බර්ලෝගේ ආකෘතිය හා ඉහත දක්වා ඇති රූප සටහන සසඳා බලන විට වඩාත් සමීප කරුණ/කරුණු වන්නේ,

(1) A ය. (2) A හා B ය. (3) B ය.
(4) B හා C ය. (5) D ය.

**43.** රූපවාහිනී මාධ්‍ය වැඩසටහන් පිළිබඳ දර්ශක (Ratings) සම්බන්ධයෙන් පහත අදහස් ඉදිරිපත් විය.

*A* - වැඩසටහන් නිෂ්පාදනය සඳහා යන වියදම හඳුනාගැනීම
*B* - සම්මාන පිරිනැමීම
*C* - වැඩසටහන විකාශය කිරීමට උචිත වේලාව තීරණය කිරීම
*D* - රූපවාහිනිය නරඹන ප්‍රේක්ෂක ස්වභාවය හඳුනාගැනීම

ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වන්නේ,

(1) *A* හා *B* වේ. (2) *A*, *B* හා *C* වේ. (3) *B* හා *C* වේ.
(4) *B*, *C* හා *D* වේ. (5) *C* හා *D* වේ.

**44.** ගෝලීයකරණය පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය වන්නේ, එය

(1) ජාතික රාජ්‍ය දුර්වල කරයි.
(2) පිළිගත් පොදු න්‍යායකින් යුක්තය.
(3) මතවාදී ප්‍රවේශයක් ගනියි.
(4) මාධ්‍ය ක්‍රියාවලියේ විවිධ සංඝටක වර්ධනය කරයි.
(5) ආත්ම කේන්ද්‍රීය මාධ්‍ය බිහිකරයි.

[ හත්වැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**45.** පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.

| | X | Y |
|---|---|---|
| *A* | මාධ්‍ය සාක්ෂරතාව | මාධ්‍යකරුවන් |
| *B* | මාධ්‍ය අධ්‍යාපනය | නිර්මාණාත්මක චින්තනය |
| *C* | විචාරක විවරණය | ග්‍රාහක සංජානනය |
| *D* | ජනප්‍රිය සංස්කෘතිය | යෝග්‍ය පරිභෝජන රටාව |

ඉහත වගුවෙහි X හි වැඩිවීම Y හි වැඩිවීම කෙරෙහි බලපාන්නේ,

(1) *A* හා *B* හි දී ය.
(2) *A* හා *C* හි දී ය.
(3) *B* හා *C* හි දී ය.
(4) *B* හා *D* හි දී ය.
(5) *C* හා *D* හි දී ය.

**46.** ගැටුම හා සහජීවනය පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැක් වේ.

*A* - ගැටුම කළමනාකරණය යනු නිරාකරණයට පත්කිරීමක් නොවේ.
*B* - ශ්‍රී ලංකාව තුළ ගෘහස්ථ සාමය හා සහජීවනය දේශීය සංස්කෘතිය විසින් අගය කරනු ලබයි.

ඉහත ප්‍රකාශ පිළිබඳ වඩාත් නිවැරදි වරණය තෝරන්න.

(1) *A* සත්‍යවන අතර *B* අසත්‍ය වේ.
(2) *A* අසත්‍යවන අතර *B* සත්‍ය වේ.
(3) *A* හා *B* ප්‍රකාශ දෙකම සත්‍ය වේ.
(4) *A* හා *B* සත්‍යවන අතර *A* ගැටලුවක් වන අතර *B* විසඳුමකි.
(5) *A* හා *B* ප්‍රකාශ දෙකම සත්‍යවන අතර *B* මගින් *A* වඩාත් අර්ථවත් කරයි.

**47.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **සදොස්** ප්‍රකාශය තෝරන්න.

(1) සමාජ ප්‍රවේගයන්ට අනුගාමීව මාධ්‍ය නිර්මාණ දිශාගත කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම මාධ්‍ය විචාරය මගින් සිදුවේ.
(2) සමාජයේ බලකේන්ද්‍රණයට අභියෝගයක් එල්ල කිරීමට ජනමාධ්‍යයන්ට ශක්තියක් පවතී.
(3) ජනමාධ්‍යයේ න්‍යාය පත්‍රය නිසා පුද්ගලයන්ට යථාර්ථවාදී ලෙස සමාජය දකින්නට අවකාශ සැලසේ.
(4) පුද්ගලයකු තම හැකියාවන්, නිපුණතාවන්, පෙනුම හා සමාජ පිළිගැනීම පිළිබඳ දරන ආකල්පය ස්ව-සංකල්පයයි.
(5) නව අදහස් මගින් සංස්කෘතිය වෙනස්වීම හෝ වැඩි දියුණු වීම සංස්කෘතික ත්වරණයයි.

**48.** භාෂා භාවිතය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

- ඒක පුද්ගල කාර්යයක් වීම
- අන්‍යෝන්‍ය සන්නිවේදනයේ දී අත්‍යවශ්‍ය වීම
- දෘෂ්ටියක් හා මතවාදයක් අවශ්‍ය වීම
- සාක්ෂරතාව අවශ්‍ය වීම

ඉහත ප්‍රකාශ අතුරෙන් භාෂා ප්‍රභේද අනුපිළිවෙල දැක්වෙන වරණය තෝරන්න.

(1) කථනය, විවරණය, රූපණය හා ලේඛනය
(2) කථනය, රූපණය, විවරණය හා ලේඛනය
(3) ලේඛනය, කථනය, විවරණය හා රූපණය
(4) රූපණය, කථනය, ලේඛනය හා විවරණය
(5) ලේඛනය, කථනය, රූපණය හා විවරණය

**49.** පහත ප්‍රකාශ සලකා බලන්න.

*A* - වතුර ගලන ශබ්දයකට මම සවන් දුනිමි.
*B* - සංගීතයෙන් අමුතුම ජවයක් මට ලැබුණි.
*C* - කථාවේ හරය මට අවබෝධ විය.
*D* - චිත්‍රපටයේ සංගීතය ඒ දර්ශනයට ගැළපෙන්නේ නැත.

ඉහත ප්‍රකාශවලට අනුරූප වන ශ්‍රාවක අවස්ථා අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) ඇසීම, ප්‍රතික්‍රියා, තේරුම්ගැනීම හා ඇගයීම
(2) තේරුම්ගැනීම, ඇසීම, ප්‍රතික්‍රියා හා ඇගයීම
(3) ඇසීම, ඇගයීම, තේරුම්ගැනීම හා ප්‍රතික්‍රියා
(4) ඇසීම, තේරුම්ගැනීම, ඇගයීම හා ප්‍රතික්‍රියා
(5) තේරුම්ගැනීම, ඇගයීම, ඇසීම හා ප්‍රතික්‍රියා

[ අටවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**50.** සංවර්ධන වැඩසටහන් හා එහි ලක්ෂණ පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A: සමුපකාර සමිති ව්‍යාපාරය — 1: ජනතාවගේ අන්‍යෝන්‍ය සහභාගීත්වයෙන් ක්‍රියාත්මක වේ.

B: ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාරය — 2: ගැමියන්ගේ කොටස් මුදල් එකතුකර ගොඩනගා ඇත.

C: ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාරය — 3: ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඉලක්ක කර ක්‍රියාත්මකයි.

D: ග්‍රාමෝදය මණ්ඩල ව්‍යාපාරය — 4: පළාත් පාලන බල ප්‍රදේශය ඉලක්ක කර ක්‍රියාත්මකයි.

සංවර්ධන වැඩසටහන් හා ලක්ෂණ අතර නිවැරදි සම්බන්ධතාව පෙන්නුම් කරන වරණය තෝරන්න.

(1) A1 , B3 , C2 , D4 (2) A2 , B4 , C1 , D3
(3) A4 , B3 , C2 , D1 (4) A3 , B4 , C2 , D1
(5) A2 , B1 , C4 , D3

## C කොටස

**26.** මානව සම්බන්ධතා පැවැත්වීමේ හා වර්ධනය කිරීමේ යාන්ත්‍රණය සන්නිවේදනය බව ප්‍රකාශ කරන ලද්දේ,

(1) වෝල්ටර් ලිප්මාන් ය. (2) චාල්ස් කූලි ය. (3) ජෝන් ඩූවී ය.
(4) විල්බර් ශ්‍රාම් ය. (5) ක්ලෝඩ් ෂැනන් ය.

**27.** මුද්‍රිත, ශ්‍රව්‍ය හා දෘශ්‍ය මාධ්‍යවල පැවති පොදු ග්‍රාහක ක්ෂේත්‍රය වෙනුවට අසමාන හා විවිධත්වයෙන් යුතු ග්‍රාහක ක්ෂේත්‍රයක් ප්‍රභවය වීම හඳුන්වන්නේ,

(1) නිර්මහාපරිමාණකරණය ලෙස ය. (2) ගෝලීයකරණය ලෙස ය.
(3) නිර්නියාමනය ලෙස ය. (4) මාධ්‍ය අභිසාරිතාව ලෙස ය.
(5) ග්‍රාහක කේන්ද්‍රීයතාව ලෙස ය.

**28.** මාධ්‍ය මගින් තොරතුරු හා අදහස් සෙවීමේ, ලබා ගැනීමේ හා බෙදා හැරීමේ නිදහස පිළිබඳ සඳහන් වන්නේ,

(1) බුද්ධිමය දේපල පනත තුළ ය. (2) තොරතුරු දැනගැනීමේ පනත තුළ ය.
(3) පුවත්පත් මණ්ඩල පනත තුළ ය. (4) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය තුළ ය.
(5) ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ය.

**29.** පෙරදින රූපවාහිනියෙන් නැරඹූ වැඩසටහනක් මතකයට නගාගෙන, එහි හරය පැහැදිලිව කෙටියෙන් පන්තියට ඉදිරිපත් කරන ලෙස ගුරුතුමා රමණීට පැවසුවේය. මෙහිදී රමණී තුළ පැවතිය යුතු හැකියාව වන්නේ,

(1) විශ්ලේෂණයයි. (2) ඇගයීමයි. (3) කාණ්ඩකරණයයි.
(4) සංස්ලේෂණයයි. (5) වියුක්තිකරණයයි.

**30.** "අපේ දරුවෝ අපි කියන කිසිම දෙයක් අහන්නේවත් කරන්නේවත් නෑ. රූපවාහිනිය දිහා ඔහේ බලාගෙන ඉන්නවා." දෙමව්පියන්ගේ මෙබඳු මැසිවිලි පිළිබඳ පර්යේෂණාත්මක පිළිතුරක් සපයන ලද්දේ,

(1) කර්ට් ලෙවින් ය. (2) විල්බර් ශ්‍රාම් ය. (3) ජෝර්ජ් ගාබ්නර් ය.
(4) පෝල් ලැසාස්ෆෙල්ඩ් ය. (5) වෝල්ටර් ලිප්මාන් ය.

**31.** ගැමි නාට්‍යය රඟදැක්වීමේ පරමාර්ථ කිහිපයක් පහත දැක්වේ.

*A* - ගර්භණී කාන්තාවන් සඳහා පවත්වන අභිචාර ක්‍රමයක් ලෙසට ය.
*B* - උපදේශාත්මක සංදේශයක් ලබාදීම පිණිස ය.
*C* - සශ්‍රීකත්වය අපේක්ෂා කරන්නක් ලෙසට ය.
*D* - අන්තර් සංස්කෘතික සම්බන්ධතාව දැක්වීමට ය.
*E* - භවබෝග විනාශය පිළිබඳ නිරූපණයක් ලෙසට ය.

මේ අතුරෙන් කෝලම් නාට්‍ය පිළිබඳ නිවැරදි වන්නේ,

(1) *A* හා *B* ය. (2) *A* හා *C* ය. (3) *B* හා *C* ය.
(4) *B* හා *D* ය. (5) *D* හා *E* ය.

**32.** ගුවන්විදුලි වැඩසටහන් නිෂ්පාදකවරයෙක් නාට්‍යයක් රඟදක්වන අවස්ථාවේ දී තත්පර කිහිපයක නිහැඬියාවක් එම නාට්‍යය තුළ දී භාවිත කළේය. මෙයින් පැහැදිලි වන්නේ,

(1) මාධ්‍ය බාධක පිළිබඳ අවබෝධයක් ලබා දීම ය.
(2) ගුවන්විදුලියට නිහැඬියාව උචිත නොවන බව පෙන්වාදීම ය.
(3) නාට්‍ය සඳහා උත්තේජනයක් ලබාදීම ය.
(4) අත්දැකීම් පසුතලය ප්‍රයෝජනයට ගැනීම ය.
(5) නාට්‍ය සන්දර්භීය ලක්ෂණ ප්‍රයෝජනයට ගැනීම ය.

[ නවවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**33.** සන්නිවේදනය හා සම්බන්ධ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

**A -** සහවේදනය **B -** විෂමජාතීය ග්‍රාහකයින් **C -** ස්ව-සංකල්පය **D -** ප්‍රදීපාගාර ක්‍රමය

ඉහත ලක්ෂණ අදාළවන සන්නිවේදන වර්ග පිළිවෙළින්,

(1) අන්තර්වර්ති, ජන, අන්තර් පුද්ගල හා සමූහ සන්නිවේදනය වේ.
(2) අන්තර්වර්ති, අන්තර් පුද්ගල, සමූහ හා ජන සන්නිවේදනය වේ.
(3) අන්තර් පුද්ගල, ජන, අන්තර්වර්ති හා සමූහ සන්නිවේදනය වේ.
(4) සමූහ, අන්තර් පුද්ගල, අන්තර්වර්ති හා ජන සන්නිවේදනය වේ.
(5) ජන, සමූහ, අන්තර්වර්ති හා අන්තර් පුද්ගල සන්නිවේදනය වේ.

**34.** සංවර්ධනයේ දී සමාජීය සම්බන්ධතා හා සමානාත්මතා ගොඩනැගීමට අදාළ ලක්ෂණයක් **නොවන්නේ**,

(1) සංවර්ධනය සඳහා සමාන අවස්ථා පැවතීමයි.
(2) පන්ති බෙදීම් තුරන් කිරීමයි.
(3) සාධාරණ හේතුන්මත වෙනස්කම් කිරීමයි.
(4) අවම අවශ්‍යතා සම්පූර්ණ කිරීමයි.
(5) විශේෂ මානව අයිතිවාසිකම් පැවතීමයි.

**35.** භාෂා භාවිතය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

*A* - පෙළ හා රූපයෙන් සමන්විත වෙයි.
*B* - දෘශ්‍ය මෝස්තර, රූපක හා සංකේත භාවිත වෙයි.
*C* - දිගු සංකීර්ණ වාක්‍ය යොදා නොගනී.
*D* - කථන ප්‍රක්ෂේපණ වාග් ව්‍යවහාරය යොදාගනී.

මෙම ප්‍රකාශයන්ට අදාළ මාධ්‍ය අනුපිළිවෙළ කුමක්ද?

(1) පුවත්පත, සිනමාව, ගුවන්විදුලිය හා රංගභූමිය
(2) රූපවාහිනිය, පුවත්පත, රංගභූමිය හා ගුවන්විදුලිය
(3) රූපවාහිනිය, රංගභූමිය, පුවත්පත හා ගුවන්විදුලිය
(4) පුවත්පත, රූපවාහිනිය, සිනමාව හා ගුවන්විදුලිය
(5) සිනමාව, රූපවාහිනිය, ගුවන්විදුලිය හා රංගභූමිය

**36.** සමීක්ෂණයක් සඳහා දත්ත රැස්කිරීමේ දී පූර්ව වාර්තාවල ඇතුළත් සංඛ්‍යා දත්ත යොදා ගන්නේ නම් ඒවා,

(1) ප්‍රමාණාත්මක දත්ත වේ.
(2) ප්‍රමාණාත්මක ප්‍රාථමික දත්ත වේ.
(3) ප්‍රමාණාත්මක ද්විතීයික දත්ත වේ.
(4) ගුණාත්මක දත්ත වේ.
(5) ගුණාත්මක ද්විතීයික දත්ත වේ.

**37.** මාධ්‍ය නියාමනය හා සම්බන්ධ කරුණු කිහිපයක් පහත දැක්වේ.

*A* - මාධ්‍ය නියෝජිතයන් මැදිහත්වෙයි.
*B* - තීන්දු හා නිර්දේශ මාධ්‍යකරුවන් විසින් පිළිපැදිය යුතු ය.
*C* - රාජ්‍ය මැදිහත්වීමක් සහිත ය.

මෙම ප්‍රකාශ අදාළ වන නියාමන ප්‍රවේශය වන්නේ,

(1) ස්වයං නියාමනයයි.
(2) අභ්‍යන්තරික නියාමනයයි.
(3) ව්‍යවස්ථාපිත නියාමනයයි.
(4) සහනියාමනයයි.
(5) රාජ්‍ය නියාමනයයි.

**38.** අන්තර්ජාලය ඔස්සේ විද්‍යුත් පුස්තකාලයකට ප්‍රවේශ වී තොරතුරු ලබාගැනීමට ඔබට හැකියාව ඇත. මේ සඳහා සෘජුව බලපාන්නේ නව මාධ්‍යයේ පහත සඳහන් කුමන ලක්ෂණය ද?


(1) දත්ත සංචිතය (Data base)
(2) අන්තර් ක්‍රියාකාරීත්වය (Interactivity)
(3) ස්වයංකරණය (Automation)
(4) ජාලගතකරණය (Networking)
(5) වේගවත් සංදේශකරණය (Fastest Messaging)

[ දහවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

Agaram.LK - Keep your dreams alive!

- අංක **39** සිට **42** දක්වා වූ ප්‍රශ්න සඳහා පහත දැක්වෙන රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.




**39.** ඉහත රූපසටහනින් දැක්වෙන්නේ සන්නිවේදන ආකෘතියක අන්තර්ගත කරුණුය. එහි A, B හා C වලට අයත් කරුණු පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

(1) ආකේතකරය, විකේතකරය, ප්‍රතිපෝෂණය
(2) සන්නිවේදකයා, පණිවිඩය, නාලිය
(3) විකේතකරය, ප්‍රතිපෝෂණය, සන්නිවේදකයා
(4) ආකේතකරය, ග්‍රාහකයා, පණිවිඩය
(5) ආකේතකරය, පණිවිඩය, විකේතකරය

**40.** ඉහත දැක්වෙන රූප සටහන අනුව A, B හා C අතර සිදුවන ක්‍රියාවලිය හේතුවෙන්,

*J* - රේඛීය සන්නිවේදනයක් සිදුවන බව දක්නට ලැබෙයි.
*K* - ප්‍රතිපෝෂණය සිදුවන බව පැහැදිලි ය.
*L* - බාධාවක් සිදුවී ඇත්දැයි හඳුනාගත හැකි ය.
*M* - සංදේශය වටහාගත් ආකාරය පැහැදිලි ය.

මෙම ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ,

(1) *J* හා *K* පමණි. (2) *K* හා *L* පමණි. (3) *L* හා *M* පමණි.
(4) *J*, *K* හා *L* පමණි. (5) *K*, *L* හා *M* පමණි.

**41.** ඉහත දක්වා ඇති රූප සටහනෙහි ඇතුළත් කරුණු වඩාත් සමීප වන සන්නිවේදන ආකෘතිය කුමක් ද?

(1) ඇරිස්ටෝටල් හා හැරල්ඩ් ලැස්වෙල් (2) චාල්ස් ඔස්ගුඩ් හා විල්බර් ශ්‍රාම්
(3) ක්ලොඩ් ෂැනන් හා විල්බර් ශ්‍රාම් (4) ක්ලෝඩ් ෂැනන් හා වොරන් වීවර්
(5) වොරන් වීවර් හා චාල්ස් ඔස්ගුඩ්

**42.** ඉහත දක්වා ඇති රූපසටහන HUB ආකෘතිය හා සසඳන විට පහත සඳහන් කරුණු අතුරෙන් වඩාත් සමීප කරුණ කුමක් ද?

(1) බලපෑම (2) පෙරහනු (3) ක්ෂේත
(4) නියාමන (5) දොරටුපාලක

**43.** මහජන සම්බන්ධතා හා ඊට අදාළ කාර්යයක් බැගින් දැක්වෙන ප්‍රකාශ යුගල කිහිපයක් පහත දැක්වේ.

*A* *i.* මාධ්‍ය මහජන සම්බන්ධතා
*ii.* බලපත්‍ර ලබා දීම

*B* *i.* වෘත්තීය මහජන සම්බන්ධතා
*ii.* පර්යේෂණ හා දැනුම

*C* *i.* ආයතනික මහජන සම්බන්ධතා
*ii.* රාජ්‍ය සම්බන්ධතා

*D* *i.* රාජ්‍ය මහජන සම්බන්ධතා
*ii.* ආචාර ධර්ම පද්ධති

ඉහත ඒවා අතුරෙන් වඩාත් සමීප සම්බන්ධතාවක් දක්වන යුගල ඇතුළත් වරණය වන්නේ,

(1) *A* හා *B* ය. (2) *A*, *B* හා *C* ය.
(3) *B* හා *C* ය. (4) *B*, *C* හා *D* ය.
(5) *A*, *B*, *C* හා *D* යන සියල්ලම ය.

Agaram.LK - Keep your dreams alive!

[ එකොළොස්වැනි පිටුව බලන්න.

www.agaram.lk



**44.** සමීක්ෂණ ක්‍රියාවලියකින් පසු එහි සාමාජිකයන් තම අත්දැකීම් පිළිබඳ සිදුකළ ප්‍රකාශ හතරක් පහත දැක්වේ.

රාධා - මාතෘකාවට අදාළව ලියවී ඇති තොරතුරු කියවා තිබීම පහසුවක් වුණා.
සුරවීර - පන්තියේ ළමයින් සියලු දෙනාගෙන්ම දත්ත ලබාගත් නිසා නියැදිය තෝරා ගැනීම පහසු වුණා.
නන්දනී - දත්ත ලබාදුන් සියලු දෙනා අගය කිරීමක් ලෙස ඔවුන්ගේ නම් අවසාන වාර්තාවට ඇතුළත් කරනවා.
ශේන් - සම්මුඛ සාකච්ඡාවට බඳුන්වන පිරිස පිළිබඳ තොරතුරු දැන සිටි නිසා සාකච්ඡාව පහසු වුණා.

මේ අතුරෙන් නිවැරදි ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ,

(1) රාධා සහ සුරවීර ය.
(2) රාධා සහ ශේන් ය.
(3) රාධා සහ නන්දනී ය.
(4) සුරවීර සහ නන්දනී ය.
(5) නන්දනී සහ ශේන් ය.

**45.** පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | X | Y |
|---|---|---|
| *A* | ස්වයං නිර්ණය | පුද්ගල ස්වාධීනත්වය |
| *B* | මාධ්‍ය පරිභෝජනය | ග්‍රාහක දර්ශකය |
| *C* | අවශ්‍යතා කේන්ද්‍රීයත්වය | සෞඛ්‍ය සේවා |
| *D* | නිර්මහාපරිමාණකරණය | පුළුල් ග්‍රාහක සමාජය |

ඉහත වගුවෙහි X හි තහවුරු වීම Y හි වැඩිවීම කෙරෙහි බලපාන්නේ,

(1) *A* හා *B* හි දී ය.
(2) *A* හා *C* හි දී ය.
(3) *B* හා *C* හි දී ය.
(4) *B* හා *D* හි දී ය.
(5) *C* හා *D* හි දී ය.

**46.** සමීක්ෂණ පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දක්වා ඇත.

A - ජාතික රූපවාහිනිය ආරම්භ වීම හා එකල එමගින් ඇති වූ බලපෑම පිළිබඳ ව සමීක්ෂණ මගින් අධ්‍යයනය කළ නොහැකි ය.

B - සමීක්ෂණ මගින් අතීත තත්ත්ව පිළිබඳ දත්ත රැස්කළ නොහැකි ය.

ඉහත ප්‍රකාශ අතුරෙන්,

(1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
(2) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
(3) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වේ.
(4) A හා B සත්‍ය වන අතර B මගින් A පිළිබඳ හේතු දක්වයි.
(5) A හා B සත්‍ය වන අතර A මගින් B පිළිබඳ හේතු දක්වයි.

**47.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

*A* : මැක්බ්‍රයිඩ් වාර්තාව - රටක සන්නිවේදන ප්‍රතිපත්ති සකස් විය යුත්තේ අසමානතා දුරු කිරීමට යි.

*B* : ෆෙඩරල් සන්නිවේදන කොමිෂන් සභාව - යටත් විජිතවල ගුවන්විදුලි මාධ්‍ය හැසිරවීම පිළිබඳ ප්‍රතිපත්ති හඳුන්වා දී තිබේ.

*C* : මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය - තම මතය දැරීමේ හා ප්‍රකාශ කිරීමේ නිදහසට අයිතියක් ඇත.

ඉහත ප්‍රකාශ අතුරෙන් ඍජු සම්බන්ධතාවක් දක්වන යුගලය/යුගල ඇතුළත් වරණය වන්නේ,

(1) *A* පමණි.
(2) *A* හා *B* පමණි.
(3) *A* හා *C* පමණි.
(4) *B* පමණි.
(5) *B* හා *C* පමණි.

[ දොළොස්වැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**48.** පහත දී ඇති සම්බන්ධතා ඇසුරෙන් පිළිතුරු සපයන්න.

*A i.* පහසුවෙන් අවබෝධ කරගත හැකි සරල ව්‍යුහයන්ගෙන් යුක්තයි.
*ii.* සාම්ප්‍රදායික සන්නිවේදනය

*B i.* සරල බව, නොගැඹුරු බව හා මහා පරිමාණ නිෂ්පාදන සහිතයි.
*ii.* ජනසන්නිවේදනය

*C i.* විඥාපන අවධියට අයත් සංස්කෘතික ප්‍රභේදයකි.
*ii.* ජනප්‍රිය සංස්කෘතිය

*D i.* ජාතික, වාර්ගික සංස්කෘතීන් යටපත් කරමින් ව්‍යාප්ත වෙයි.
*ii.* ගෝලීය සංස්කෘතිය

මේ අතුරෙන් සමීප සම්බන්ධතාවක් දක්වන යුගල ඇතුළත් වරණය වන්නේ,

(1) *A* හා *B* ය. (2) *A* හා *D* ය. (3) *B* හා *C* ය.
(4) *B* හා *D* ය. (5) *C* හා *D* ය.

**49.** ගැටුමක් නිරාකරණය කිරීම සඳහා ඔබට මැදිහත්වීමට සිදුවූයේ යැයි සිතන්න. එම ගැටුම තේරුම් ගැනීමෙන් අනතුරුව ඔබ විසින් ක්‍රියාත්මක කරනු ලබන වඩාත් සුදුසු ඊළඟ පියවර වන්නේ,

(1) ප්‍රතිපක්ෂ සමඟ සන්නිවේදනය කිරීමයි.
(2) හොඳම විසඳුම තෝරා ගැනීමයි.
(3) තෙවන පාර්ශවයක් මැදිහත්කර ගැනීමයි.
(4) යෝජනා ඉදිරිපත් කිරීමයි.
(5) ගැටුමට විකල්ප සොයා ගැනීමයි.

**50.** විවිධ ආයතන පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| A: ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය | 1: ජනාධිපතිවරයා විසින් සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබයි. |
| B: ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම | 2: විෂයභාර ඇමතිවරයා විසින් සාමාජිකයන් පත් කරනු ලබයි. |
| C: ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය | 3: විවිධ ක්ෂේත්‍රවල විද්වතුන්ගෙන් සමන්විත මණ්ඩලයකි. |
| D: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | 4: ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් නිල බලයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි. |

මේ අතුරෙන් ආයතන හා නිලතල අතර නිවැරදි සම්බන්ධතාව පෙන්නුම් කරන වරණය තෝරන්න.

(1) A1 , B3 , C2 , D4 (2) A4 , B2 , C3 , D1
(3) A3 , B2 , C4 , D1 (4) A1 , B2 , C3 , D4
(5) A4 , B3 , C2 , D1

* * *

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

37735

AL/2020/29/S-II (NEW/OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව/පැරණි නිර්දේශය – புதிய/பழைய பாடத்திட்டம் – New/Old Syllabus

NEW/OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II
தொடர்பாடலும் ஊடகக் கற்கையும் II
Communication & Media Studies II

29 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **A** හා **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත වේ.
* **A කොටස** ප්‍රශ්න **තුනකින්** ද **B කොටස** ප්‍රශ්න **අටකින්** ද සමන්විත වේ.
* **A කොටස පැරණි හා නව නිර්දේශය** යන දෙකම ඇසුරින් සකස් කර ඇත.
* **B කොටස** තුළ **4, 5, 6, 7** ප්‍රශ්න **පැරණි නිර්දේශයට** ද **8, 9, 10, 11** ප්‍රශ්න **නව නිර්දේශයට** ද අනුව සකස් කර ඇත.
* **A කොටසින්** ප්‍රශ්න **දෙකකට** හා **B කොටසින්** ඕනෑම ප්‍රශ්න **තුනක්** තෝරාගෙන ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සැපයිය යුතුය.

## A කොටස

**1.** සන්නිවේදනය තේරුම් ගැනීමටත් සාර්ථකව ක්‍රියාත්මක කිරීමටත් එහි මූලික කරුණු පිළිබඳ අවබෝධයක් පැවතිය යුතුය.

(i) ආගමික අවස්ථාවක දී අනුගමනය කරන නිර්වාචික සන්නිවේදන ක්‍රම **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) පාසල් මාධ්‍ය කවයේ දී සමූහ සන්නිවේදනය යොදා ගැනීමේ ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) විධිමත් හා අවිධිමත් සන්නිවේදනය අතර පවතින වෙනස්කම් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

(iv) සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග **හතරක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 16)

**2.** ජනමාධ්‍යවල නිර්මාණශීලී අන්තර්ගතය ග්‍රාහක ඵලදායීතාව වර්ධනය කරයි.

(i) රූපවාහිනී මාධ්‍ය සඳහා භාෂාව භාවිත කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) කිසියම් ආයතනයක හෝ සංවිධානයක මහජන සම්බන්ධතා ක්‍රියාවලිය හා සම්බන්ධ පාර්ශ්ව **හතරක්** දක්වා ඉන් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 08)

(iii) නිර්මාණාත්මක සන්නිවේදනයේ දී ජනශ්‍රැතිකාංග යොදා ගැනීමේ වැදගත්කම කරුණු **තුනක්** ඇසුරෙන් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 12)

(iv) ගුවන්විදුලි මාධ්‍යයේ නිර්මාණශීලී වැඩසටහන් වර්ග **හතරක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 16)

**3.** සන්නිවේදන මාධ්‍ය ප්‍රබල සමාජීය දෘෂ්ටිවාදී උපකරණයකි.

(i) ෂැනන් හා වීවර් සන්නිවේදන ආකෘතියේ පවතින විශේෂතා **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) ජනමාධ්‍යයේ දක්නට ලැබෙන ජනප්‍රිය සංස්කෘතික ලක්ෂණ **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ආයතනයක් තම බාහිර මහජන සම්බන්ධතා ගොඩනගා ගැනීම සඳහා භාවිත කරනු ලබන මෙවලම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) සමාජ මාධ්‍ය මානවයාගේ යහපතට මෙන්ම අයහපතට බලපාන ආකාරය පිළිබඳව කරුණු **දෙක බැගින්** පදනම් කරගෙන වචන 200කට නොඅඩු පුවත්පත් ලිපියක් රචනා කරන්න. (ලකුණු 16)

[දෙවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your,dreams alive!
agaram.lk

www.agaram.lk



## B කොටස

**4.** සමාජයෙහි උද්ගතව පවතින විවිධ ගැටලු පිළිබඳ ජනමාධ්‍ය මගින් ලබාදෙන අවබෝධය ග්‍රාහකයාට වැදගත් වේ.

(i) විරෝධාකල්ප මාධ්‍ය සතු ලක්ෂණ **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) ප්‍රවර්ධන මිශ්‍රයට අයත් කරුණු **හතර** දක්වා ඉන් **එකක්** පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ගෘහය තුළ ගෘහස්ථ සාමය හා සහජීවනය බිඳ වැටීම, පෙන්නුම් කරන ආකාර **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

(iv) දරුවන්ට සිය ඉගෙනුම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා මාධ්‍ය අධ්‍යාපනය ලබා දීම වැදගත් වන ආකාරය කරුණු **හතරක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 16)

**5.** මාධ්‍ය ක්‍රියාත්මකවන ආකාරය පිළිබඳ අවබෝධ කරගැනීමට පුරවැසියා විචාරශීලී වීම අවශ්‍ය වේ.

(i) පුරවැසි මාධ්‍යයේ විශේෂතා **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) මාධ්‍ය සංස්කෘතියේ ලක්ෂණ **දෙකක්** නම් කර ඒවා රූපවාහිනී වෙළෙඳ දැන්වීම් හා ටෙලිනාට්‍ය තුළින් නිරූපණය වන ආකාරය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 08)

(iii) "ජනමාධ්‍ය අන්තර්ගතය අවබෝධ කරගැනීමේ දී මාධ්‍ය සාක්ෂරතාව අත්‍යවශ්‍ය වේ." මෙම ප්‍රකාශය කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) සෞන්දර්යාත්මක හා සදාචාරාත්මක විචාර ප්‍රවේශ පිළිබඳ කරුණු **දෙක බැගින්** ගෙන උදාහරණ සහිතව විග්‍රහ කරන්න. (ලකුණු 16)

**6.** (i) සමාජානුයෝජන කාර්යය සඳහා බලපාන සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) ඓතිහාසික කතාවක් ඇසුරෙන් ළමා නාට්‍යයක් නිර්මාණය කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු **දෙකක්** පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ග්‍රාමීය සංවර්ධන ගැටලු විසඳීමේ දී සමූහ සන්නිවේදන නිපුනතාවක් වශයෙන් සම්මුඛ සාකච්ඡා මගින් ලැබෙන ප්‍රයෝජන **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

(iv) පුවත්පත් මාධ්‍ය සඳහා භාෂාව භාවිත කිරීමේ දී අවධානය යොමුකළ යුතු කරුණු **හතරක්** උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 16)

**7.** ගෝලීය සමාජයක සංවර්ධන කටයුතු සිදුකිරීමේ දී සංස්කෘතික ලක්ෂණ පිළිබඳව ද අවධානය යොමුකළ යුතු ය.

(i) ගෝලීයකරණ සංකල්පයෙහි ලක්ෂණ **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) උප සංස්කෘතීන් **දෙකක්** නම් කර, ඉන් **එකක** පවත්නා සංස්කෘතික විශේෂතා පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 08)

(iii) රටක සංස්කෘතිය පෝෂණයෙහිලා සංස්කෘතික හුවමාරුව උපකාර වන ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) සංවර්ධන නිලධාරියෙක් ලෙස ඔබට ග්‍රාමීය ජල ව්‍යාපෘතියක අවසන් වාර්තාව සකස් කිරීමට සිදුවී තිබේ. එම වාර්තාවට ඇතුළත් විය යුතු කරුණු **හතරක්** විස්තර කරන්න. (ලකුණු 16)

[තුන්වැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**8.** මාධ්‍ය පිළිබඳ අධ්‍යයනයේ දී වර්තමාන ලෝක ප්‍රවණතා පිළිබඳ අවබෝධය අවශ්‍ය වේ.

(i) විචාරශීලී ග්‍රාහකයෙක් සතුවිය යුතු කුසලතා **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19 වන වගන්තියෙහි අන්තර්ගත කරුණු **දෙකක්** දක්වා, ඉන් **එකක්** පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ලෝකයේ මාධ්‍ය නියාමනය සඳහා භාවිත කරන මූලික ප්‍රවේශ **හතර** නම් කර ඉන් **දෙකක්** පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 12)

(iv) බුද්ධිමය දේපළ පනත හා තොරතුරු දැනගැනීමේ පනත පිළිබඳව පහත කරුණුවලට අදාළව විස්තර කරන්න.

(a) හැඳින්වීම

(b) කාර්යභාරය (ලකුණු 16)

**9.** "ජනතාවගේ සන්නිවේදන අවශ්‍යතා ඉටුකරලීමේ දී ජනමාධ්‍යයට වඩා නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය ප්‍රබල වේ./ප්‍රබල නොවේ." මැයෙන් පැවැත්වෙන විවාදයක් සඳහා තොරතුරු රැස්කිරීමට ඔබට සිදුවී ඇත.

(i) යුනෙස්කෝ ආයතනය මගින් ප්‍රකාශිත 'Many Voices One World' කෘතියෙහි දැක්වෙන ජනමාධ්‍යට සුවිශේෂ කාර්යභාර **හතර** නම් කරන්න. (ලකුණු 04)

(ii) සංදේශ නිර්මාණය කර බෙදා හැරීම සිදුකළ හැකි සමාජ මාධ්‍ය යෙදවුම් **හතරක්** නම් කර ඉන් **දෙකක** ක්‍රියාකාරීත්වය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) නව මාධ්‍යයන්හි දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) මාධ්‍ය අභිසාරිතාව නිසා ජනමාධ්‍ය හා එහි ග්‍රාහක ස්වභාවය වෙනස් වී ඇති ආකාරය කරුණු **හතරක්** ඔස්සේ විග්‍රහ කරන්න. (ලකුණු 16)

**10.** 'ජනතාවගේ මාධ්‍ය සාක්ෂරතාව මැනබැලීම සඳහා සමීක්ෂණ යොදාගත හැකි ය.'

(i) සමීක්ෂණ වර්ග **දෙක** නම් කරන්න. (ලකුණු 04)

(ii) සමීක්ෂණ පැවැත්වීමේ වාසි **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) මාධ්‍ය සංදේශ විචාරය කිරීමේ දී යොදාගත හැකි දෘෂ්ටිවාද **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) ග්‍රාහකයෙකුට මාධ්‍ය සාක්ෂරතාව ඇතිකර ගැනීම වැදගත් වන ආකාරය කරුණු **හතරක්** ඇසුරෙන් විග්‍රහ කරන්න. (ලකුණු 16)

**11.** පාසල් නිවාසාන්තර මලල ක්‍රීඩා උළෙල උත්කර්ෂවත් කරගැනීමේ දී මහජන සම්බන්ධතා නිලධාරීන්, මාධ්‍ය නිලධාරීන් හා සිද්ධි කළමනාකරුවන්ගේ දායකත්වය අත්‍යවශ්‍ය බව විදුහල්පතිතුමා අවධාරණය කළේය.

(i) ආයතනයක් ලෙස පාසල සඳහා මහජන සම්බන්ධතාව අවශ්‍ය වන අවස්ථා **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) මහජන සම්බන්ධතා නිලධාරියෙක් පාසල් ක්‍රීඩා උළෙලේ දී භාවිතයට ගතයුතු කුසලතා **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ක්‍රීඩා උළෙල පිළිබඳ ප්‍රචාරණ කටයුතුවල දී මාධ්‍ය නිලධාරියා විසින් ඉටුකළ යුතු කාර්ය **තුනක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) ක්‍රීඩා උළෙලෙහි සිද්ධි කළමනාකරණයට අදාළ සැලැස්මෙහි පහත කරුණු පිළිබඳ පැහැදිලි කරන්න.

(a) ස්ථානය

(b) න්‍යාය පත්‍රය

(c) ආරාධිතයින් තීරණය කිරීම

(d) අවදානම් තක්සේරුව (ලකුණු 16)

* * *

Agaram.LK - Keep your,dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk

agaram.lk